## PD – 02

### වනාන්තර පර්යන්ත ප්‍රදේශයන්හි කිතුල් කර්මාන්තය සඳහා සාම්ප්‍රදායික දැනුමෙහි ඇති විභවතාව

ධම්මික හේවගේ[1], මංජුල කරුණාරත්න[2], ආර්. කේ. චමින්ද කුමාර[3] සහ ආර්. කේ. සිරිසේන[4]

[1] පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව.
[2] University of Agdar, Norway.
[3] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව.
[4] පෙතියකන්ද, කුඩව, වැද්දාගල, ශ්‍රී ලංකාව.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ වනාන්තර පර්යන්ත ප්‍රදේශයන්හි කිතුල් *(Caryota urens.L)* කර්මාන්තය සඳහා සාම්ප්‍රදායික දැනුමෙහි ඇති විභවතාව අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනු ලැබුයේ සිංහරාජ වනාන්තරයේ වයඹදිග බෑවුමෙහි පර්යන්ත කලාප වන කුඩව, පෙතියකන්ද, පිටකැලේ , කෙටලපත්තල, කොස්ගුලන ගම්මානයන් 5 ය. සෑම ගමකින් ම පහළොස් දෙනා බැගින් 75 දෙනෙකුගෙන් යුත් නියදියක් මෙහි දී යොදා ගන්නා ලදී. දීර්ඝ ඉතිහාසයක් ඇති සාම්ප්‍රදායික කිතුල් කර්මාන්තය සාම්ප්‍රදායික දැනුම මත ම වර්තමානයේ දී ද ක්‍රියාත්මක වෙයි. එහෙත් වර්තමාන තරුණ පරපුරෙන් මෙම සාම්ප්‍රදායික දැනුම ගිලිහී යන ආකාරය දක්නට ලැබේ. කිතුල් කර්මාන්තය ආශ්‍රිත දැනුම එක්රැස් කොට ලේඛනගත කිරීමත් එම දැනුමේ ප්‍රායෝගික වටිනාකම අධ්‍යයනය කිරීමත් මෙම අධ්‍යයනයේ වැදගත්කම ලෙස දැක්විය හැකි ය. දත්ත රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රමවේදය ද දත්ත ඉදිරිපත් කිරීමේ දී වගු, සිතියම්, ඡායාරූප සහ සිද්ධි අධ්‍යයන ක්‍රමවේද භාවිත කරන ලදී. කිතුල් ගසක් තෝරාගෙන එය හැර ගසා මල්පදම් කොට අවසානයේ නිෂ්පාදන වෙළඳපොළ කරා රැගෙන යාම දක්වා ම කිතුල් කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම විහිදී පවතියි. සාම්ප්‍රදායික මල් පදම් කිරීමේ ක්‍රමය වෙනුවට ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් හඳුන්වා දුන් කීවැර රසායනික සංයෝගය යොදා මල් පදම් කිරීමෙන් ලබා ගන්නා 'තේදිය'වලින් ලබා ගන්නා පැණි, හකුරුවල ආවේණික රස වෙනස් බව නියැදියෙන් 75% දෙනා ප්‍රකාශ කළ අතර එම රසායනිකය යෙදූ කිතුල් ගස්වල ආයු කාලය ඉතා කෙටි බව 100% දෙනා ප්‍රකාශ කළහ. එසේ ම සාම්ප්‍රදායික ක්‍රමයට ලබා ගන්නා 'රා'වලට වඩා මෙම රසායනිකය යෙදූ ගස්වලින් ලබා ගන්නා රාවල අමිහිරි රසයක් පවතින බව 95%දෙනා ප්‍රකාශ කළහ. වර්තමානය වන විට මෙම කර්මාන්තයෙන් ජනතාව විකර්ෂණය වීමට බලපෑ ප්‍රබල හේතුවක් වනුයේ තේ කර්මාන්තය ව්‍යාප්ත වීමයි. මෙනිසා කාර්යබහුල වූ ජනතාව කෙරෙන් සාම්ප්‍රදායික දැනුම සහ භාවිතයන් ශීඝ්‍රයෙන් ගිලිහී යමින් තිබේ. කිතුල් කර්මාන්තය මූලික ලෙස ම රඳා පවතින්නේ සාම්ප්‍රදායික දැනුම මත බව නිගමනය කළ හැකි ය. එවැනි සාම්ප්‍රදායික ක්‍රමවේද ගුණාත්මක කිතුල් නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** *කිතුල් කර්මාන්තය, සාම්ප්‍රදායික දැනුම, සිංහරාජ වනාන්තරයේ වයඹදිග බෑවුම*